# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2093/37 - 2018 ඔක්තෝබර් මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2018.10.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 104/44

**භාර ආඥාපනත (87 වන පරිච්ඡේදය)**

114 වැනි වගන්තිය යටතේ නියෝගය

''ආත්ම ජෝති පදනම'' භාරකරුවන්, එනම් :-

1. අයියදොරෙයි සෝමස්කන්ද මූර්ති නොහොත් අයියදොරෙයි තිරුඥානසම්බන්ධන්
2. කන්දයියා බාලසුබ්‍රමනියම්

යන අය (87 වන අධිකාරය) වූ භාර ආඥාපනතේ 114 වන වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා වෙත ඔවුන්ගේ භාරය සංස්ථාගත කිරීම සඳහා අයදුම්කර ඇති හෙයින් ද ;

එම නිසා, ඉහත කී ආඥාපනත මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධිකරණ අමාත්‍ය, තලතා අතුකෝරල වන මා විසින් ඉහත නම් සඳහන් භාරකරුවන් සංස්ථාගත කිරීම අනුමත කර, පහත පරිදි නිර්දේශ කර ප්‍රකාශයට පත් කිරීමට නියෝග කරමි.

(අ) කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මුරුගේසු සහ නීලකන්දන් විසින් සහතික කරන ලද අංක 136 දරන සහ 2018, ජුනි මස 30 දිනැති භාර ප්‍රකාශනය මගින් සංශෝධනය කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මුරුගේසු සහ නීලකන්දන් විසින් සහතික කරන ලද අංක 2081 දරන සහ 2012 අගෝස්තු මස 7 වන දිනැති භාර ප්‍රකාශනය සහ එකී භාරය යටතේ දැනට නිසි පරිදි පත් කරන ලද ඉහත නම් දරන භාරයේ භාරකරුවන් සහ ඔවුන්ගේ අනුප්‍රාප්තිකයින් ''ආත්ම ජෝති පදනම'' යන නාමය සහ අභිධානය යටතේ අවිච්ජින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් සහිත සංස්ථාවක් විය යුතු ය.

(ආ) එකී භාරය වෙනුවෙන් එකී නාමය සහ අභිධානය යටතේ චංචල හෝ නිශ්චල දේපළක් මිල දී ගැනීමට, භාර ගැනීමට, රඳවා ගැනීමට, ණයට ලබා ගැනීමට හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීමට, විකිණීමට, හුවමාරු කිරීමට, උකස් කිරීමට, ඔඩපනය කිරීමට, බදු දීමට හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමට ඉහත නම් දරන භාරකරුවන්ට හැකියාව ඇත්තේ ය.

(ඇ) ශ්‍රී ලංකාවේ ඕනෑම අධිකරණයක දී හෝ වෙනත් ස්ථානයක දී එකී භාරය සම්බන්ධයෙන් පැන නැගෙන සියලු නඩු පවරනු ලැබීමට, උත්තර දීමට හා උත්තර ගොනු කිරීමට, විත්තිවාචක ඉදිරිපත් කිරීමට හා විත්තිවාචක ඉදිරිපත් කරනු ලැබීමට නීතිය අනුව එකී නාමය සහ අභිධානය මගින් භාරකරුවන්ට හැකියාව සහ බලය ඇත්තේ ය.

මා හට අවශ්‍ය බව පෙනී යන පරිදි, මෙම නියෝගය, අවස්ථානුකූලව අවලංගු කිරීම, කලින් කල වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම කරනු ලැබිය හැකි ය.

තලතා අතුකෝරල,
අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 ඔක්තෝබර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

11 - 136

1A - PG 4292 — 107 (2018/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*